
## සිතියම් අංක 06 කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මිනිස් භූමි අනුපාතය

කොට්ඨාසයේ මිනිස් භූමි අනුපාතය සැකසීමේදී ද පාදක කරගෙන ඇත්තේ 2019 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා සම්පාදිත සම්පත් පැතිකඩෙහි සඳහන් ජනසංඛ්‍යාවත්, මිනින්දොරු දෙපාර්තමේන්තුවේ ග්‍රාම නිලධාරී වසම් මායිම් සිතියමත්ය. මෙමගින් එක් පුද්ගලයෙකුට කොපමණ භූමි ප්‍රමාණයක් වෙන් විය හැකිද යන්න ගණනය කර ඇති අතර භූමි ප්‍රමාණය හෙක්ටයාර වලින් සලකා ඇත. සිතියම් අංක 06 ට අනුව වැඩිම මිනිස් භූමි අනුපාතයක් වාර්තා වනුයේ අඩවිකන්ද, සූදගල, ඇදිරියන්වල, එරත්න හා වළඳුර යන වසම් වලින් වන අතර එහි අඩුම අගයන් වාර්තා වනුයේ දෙල්ගමුව, උඩකඩ, බෝධිමළුව, පරකඩුව, කොස්ගොඩ, යන වසම් වලිනි. එනම් මිනිස් භූමි අනුපාතය අඩු වසම් වල භූමිය සඳහා වැඩි තරකාරීත්වයක් පවතින බව පෙන්වා දිය හැකිය. වගු අංක 03 හි මෙම දත්තයන් ද පෙන්වා දී ඇත.

සිතියම් අංක 06 කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මිනිස් භූමි අනුපාතය



වගු අංක **03** කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජනගහන දත්ත

| අනු අංකය | ග්‍රාම නිලධාරි වසම් අංකය | ග්‍රාම නිලධාරි වසමේ නම | පුද්ගලයින් සංඛ්‍යාව | ජනඝනත්වය | මිනිස් භූමි අනුපාතය |
|---|---|---|---|---|---|
| 01 | 127 | පත්බේරිය | 3492 | 5.56 | 0.18 |
| 02 | 161 | එරත්න | 1783 | 2.63 | 0.38 |
| 03 | 127 B | පත්බේරිය / බටහිර | 2744 | 6.90 | 0.14 |
| 04 | 160 | ඇදිරියන්වල | 2057 | 2.23 | 0.45 |
| 05 | 146 A | අමුහේන්කන්ද | 3399 | 7.30 | 0.14 |
| 06 | 161 B | අඩවිකන්ද | 996 | 0.85 | 1.17 |
| 07 | 160 A | දෙවිපහල | 3082 | 3.28 | 0.31 |
| 08 | 146 | තලාවිටිය | 3260 | 7.41 | 0.13 |
| 09 | 161 C | ලස්සකන්ද | 2101 | 3.14 | 0.32 |
| 10 | 161 A | සූදගල | 2212 | 1.83 | 0.55 |
| 11 | 127 C | මෙනේරිපිටිය | 3676 | 6.80 | 0.15 |
| 12 | 127 A | පරකඩුව | 2419 | 21.91 | 0.05 |
| 13 | 146B | බෝධිමළුව | 3969 | 23.11 | 0.04 |
| **අනු අංකය** | **ග්‍රාම නිලධාරි වසම් අංකය** | **ග්‍රාම නිලධාරි වසමේ නම** | **පුද්ගලයින් සංඛ්‍යාව** | **ජනඝනත්වය** | **මිනිස් භූමි අනුපාතය** |
| 14 | 158 | පුස්සැල්ල | 3605 | 5.59 | 0.18 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 15 | 148 | පොහොරබාව | 2602 | 4.78 | 0.21 |
| 16 | 159 A | මිල්ලවිටිය | 4422 | 8.39 | 0.12 |
| 17 | 159 D | කීරගල | 2531 | 9.41 | 0.11 |
| 18 | 159 B | එක්නැලිගොඩ / උතුරු | 1716 | 5.39 | 0.19 |
| 19 | 148 A | මියනදෙණිය | 1966 | 3.42 | 0.29 |
| 20 | 157 | කඳන්ගොඩ | 2118 | 12.09 | 0.08 |
| 21 | 159 | වතුයාය | 1424 | 9.33 | 0.11 |
| 22 | 150 A | උඩකඩ | 1010 | 26.23 | 0.04 |
| 23 | 157 A | දකුණු කඳන්ගොඩ | 2532 | 11.44 | 0.09 |
| 24 | 155 B | දෙල්ගමුව | 3147 | 27.75 | 0.04 |
| 25 | 159 C | එක්නැලිගොඩ | 1810 | 16.77 | 0.06 |
| 26 | 156 C | ඕවිටිගම | 1172 | 5.42 | 0.18 |
| 27 | 156 A | තෙප්පනාව ඉහලගම | 2592 | 7.53 | 0.13 |
| **අනු අංකය** | **ග්‍රාම නිලධාරි වසම් අංකය** | **ග්‍රාම නිලධාරි වසමේ නම** | **පුද්ගලයින් සංඛ්‍යාව** | **ජනඝනත්වය** | **මිනිස් භූමි අනුපාතය** |
| 28 | 155 C | පහල කුරුවිට | 2697 | 8.06 | 0.12 |
| 29 | 154 | වළඳුර | 2094 | 2.76 | 0.36 |
| 30 | 154 B | නඩුකාරදෙණිය | 2312 | 10.00 | 0.10 |


| | | | | | |
|---|---|---|---|---|---|
| 31 | 155 | කුරුවිට | 3972 | 9.22 | 0.11 |
| 32 | 156 | තෙප්පනාව මැදගම | 2374 | 7.69 | 0.13 |
| 33 | 155 D | පාතගම | 3445 | 8.71 | 0.11 |
| 34 | 156 B | තෙප්පනාව පහලගම | 1400 | 6.92 | 0.14 |
| 35 | 154 A | කාහේන්ගම | 4740 | 11.72 | 0.09 |
| 36 | 155 A | කිතුල්පෙ | 3846 | 6.11 | 0.16 |
| 37 | 154 D | කාහේන්ගම / බටහිර | 3880 | 9.97 | 0.10 |
| 38 | 154 E | කොස්ගොඩ | 2616 | 21.54 | 0.05 |
| 39 | 154 C | ගළකගම | 2552 | 8.42 | 0.12 |
| | **එකතුව** | | **1,03,765** | | |

## සිතියම් අංක 07: කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ භූ විෂමතාවය

කුරුවිට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ භූ විෂමතාවය ගැන සලකන විට මෙම කොට්ඨාසය මුහුදු මට්ටමේ සිට උස මීටර් 20 – 1500 දක්වා අන්තරයක පිහිටයි. භූ විෂමතා සිතියම අධ්‍යනයේදී පෙනී යනුයේ කොට්ඨාසයේ උතුරු, ඊසාන හා නැගෙනහිර මායිම් ඔස්සේ උච්ඡත්වය වැඩි කොටස් ද, දකුණු, නිරිත හා බටහිර මායිම් ඔස්සේ උච්ඡතිවය අඩු කොටස් ද, පිහිටා ඇති බවයි. කොට්ඨාසයේ පහත්ම භූමි ප්‍රදේශය ලෙස කුරුවිට නගර ආසන්නයේ පිහිටි පහල කුරුවිට ග්‍රාම නිලධාරී වසමේ පැරඩයිස්වත්ත හඳුනාගෙන ඇත. කොට්ඨාසයේ උසම ප්‍රදේශය වශයෙන් අඩවිකන්ද ග්‍රාම නිලධාරී වසම ආශ්‍රිතව, ඊසාන දිග සීමාව ඔස්සේ වැටී ඇති කොටසක් හඳුන්වා දිය හැකි අතර එය මීටර් 1400 ට වැඩි උසක් ගනී. උතුරු සීමාවේ පිහිටි හීන් පිදුරුතලාව, කටුකිතුල්හේන, ඇල්ලදූරගල ආදි වශයෙන් අධික ලෙස විච්චින්නවූ බෑවුම් සහිත කඳු පද්ධතියකින් කොට්ඨාසයේ භූ විෂමතාවය නිර්මාණය වී ඇත. එම කඳු පද්ධතිය මුහුදු මට්ටමේ සිට අඩි 3000 ක පමණ වන උච්ඡත්වයකින් පිහිටා ඇති අතර, මෙම කඳු පද්ධතියෙන් උතුරු කොටස කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් වේ.

කුරුවිට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ බටහිර සහ දකුණු කොටස් රැලි සහිත බිම් වලින් යුක්ත වන අතර සංකීර්ණ වූ භූ විෂමතා ලක්ෂණ එහි නොමැත. පැරඩයිස්වත්ත, කුරුවිට පාම්ගාර්ඩ්න්, කරපිංච යන ප්‍රදේශ ඉතා පහත් භූමි ප්‍රදේශ වශයෙන් පිහිටා ඇත. මෙම තොරතුරු පහත සිතියම් අංක 07 හි පෙන්වා දී ඇත.

සිතියම් අංක 07: කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ භූ විෂමතාවය



## සිතියම් අංක 08 : කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජලවහනය

කොට්ඨාසයේ භූ විෂමතාවයට අනුරූපීව ජල වහන රටාව නිර්මාණය වී ඇති අතර කොට්ඨාසය පුරා පැතිරී ඇති ක්ෂුද්‍ර ජල පෝෂක බොහොමයක් එක්ව කුරු ගංගා ද්‍රෝනිය නිර්මාණය වී ඇති අතර, කුරු ඟඟ කොට්ඨාසයේ ඊසාන මායිමේ සිට නිරිතදිග මායිම දක්වා ගලා ගොස් කොට්ඨාසයේ සීමාව ද පසු කරමින් කුරුගංමෝදරදී කළු ඟඟට එක් වෙයි. කළු ගඟේ ප්‍රධාන අතු ගංගාවක් ලෙසින් ද කුරු ගඟ හඳුනාගෙන ඇත. ඒ අනුව කොට්ඨාසයේ ජල අවශ්‍යතාවය සපුරාලන ප්‍රධානතම ජල මූලාශ්‍රය වශයෙන් කුරු ඟඟ පෙන්වා දිය හැකිය. පහත සිතියම් අංක 08 මගින් කොට්ඨාසයේ කුරු ගං ද්‍රෝනිය පෝෂණය වන ජල වහන රටාව නිර්මාණය වී ඇති අයුරු පෙන්වා දී ඇත.